# මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය

*දැක්ම - මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙන් තොර නිරෝගී, සුරක්ෂිත සහ ආරක්ෂිත රටක් කරා...*

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

DRAFT

## පටුන

1. හැඳින්වීම…………………………………..4-6
2. ඉලක්කය සහ අරමුණු……………………………………..7
3. ප්‍රතිපත්තිය…………………………………………………8
4. ප්‍රතිපත්ති සාරාංශය……………………………………………8-18

DRAFT

හැඳින්වීම

**මත්ද්‍රව්‍ය ගැටලුවෙහි ප්‍රතිඵල**

නීතිවිරෝධී ලෙස මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ජාවාරම් කිරීම සහ ඒවා අනිසි ලෙස භාවිත කිරීම මෙන්ම සෞඛ්‍යය, සුබසාධනය සහ ජාතික සංවර්ධනය කෙරෙහි ඒවායේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය දැඩි අවධානයක් යොමු කරයි. මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් අඛණ්ඩව අධිමාත්‍රා වීම නිසා ඇති වන මරණ (overdose deaths), ස්ථිර ශාරීරික හා මානසික හානි, එච්.අයි.වී., හෙපටයිටිස්-සී සහ අනෙකුත් රුධිරය හරහා බෝවන රෝග, මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ මෙන්ම පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන් විනාශ වීම සිදුවේ. මෙම ගැටලු සමාජ-ආර්ථික ප්‍රගතිය, සුරක්ෂිතතාව සහ ස්ථාවරත්වය ද අඩාල කෙරෙන අතර මානව, ස්වභාවික සහ මූල්‍ය සම්පත් අඩු වීමට ද හේතු වේ. කෘතිම මත්ද්‍රව්‍ය සහ නව මනෝකාරක මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය, මත්ද්‍රව්‍ය වෙළඳපොළවල් පුළුල් වීම, නීතිවිරෝධී වගාවන් සහ ජාවාරම් සහ ඖෂධ අනිසි ලෙස භාවිතය ඉහළ යාම ඇතුළු පවතින හා අලුතින් උද්ගත වන අභියෝග රජය විසින් හඳුනා ගනු ලැබේ. මත්ද්‍රව්‍ය ජාවාරම, දූෂණය සහ සංවිධානාත්මක අපරාධ, එනම් මිනිස් ජාවාරම, ජාවාරම් සඳහා දියුණු තාක්ෂණය, භාවිතය විද්‍යාත්මක මෙවලම්, අන්තර්ජාලය සහ තැපැල් සේවා භාවිත කිරීම, සයිබර් අපරාධ සහ මුදල් විශුද්ධිකරණය අතර වර්ධනය වන සම්බන්ධතා පිළිබඳව ද රජය සැලකිල්ලක් දක්වයි. එමෙන්ම, කෘත්‍රිම මත්ද්‍රව්‍ය සමග ඇති වන අවදානම ඉහළ යාම, පාලනයට ලක් කර ඇති ඖෂධ වෛද්‍යමය නොවන අවශ්‍යතා සඳහා භාවිතය සහ ඒ ආශ්‍රිත විද්‍යාත්මක, නීතිමය සහ නියාමන අභියෝග ද රජය විසින් හඳුනා ගෙන ඇත.

**ජාත්‍යන්තර බැඳීම්; එක්සත් ජාතීන්ගේ සම්මුතීන්, ජාත්‍යන්තර ප්‍රතිපත්ති ලේඛන සහ ජාත්‍යන්තර පාලන ආයතන විසින් සම්මත කරන ලද යෝජනා**

තවද, රජය විශේෂයෙන්ම, 1961 මාදක ඖෂධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කේවල සම්මුතිය, 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතිය, 1988 මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍යයන් නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ ශ්‍රී ලංකාව විසින් සංශෝධනය කර අත්සන් කරන ලද මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යය පිළිබඳ කලාපීය සහයෝගිතාව පිළිබඳ දකුණු ආසියානු සංගමයේ සම්මුතිය යටතේ වන සිය ජාත්‍යන්තර බැඳීම් පිළිබඳව පූර්ණ දැනුවත්භාවයකින් යුතුව කටයුතු කරයි. මෙම ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුතීන් සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර ප්‍රතිපත්ති ලේඛනවලට අනුකූලව කටයුතු කිරීමට රජය කැපවී සිටින අතර දේශීය තත්ත්වය හා අවශ්‍යතා සපුරාලීම සඳහා ඒවා කාර්යක්ෂමව දේශීය වශයෙන් අදාළ කර ගැනීම ද සහතික කරයි. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ප්‍රතිපත්ති කෙරෙහි වන කැපවීම් සියල්ල ක්‍රියාවට නැංවීම සඳහා මෙන්ම මාදක ඖෂධ පිළිබඳ කොමිෂන් සභාව (CND), එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සහ ජාත්‍යන්තර මාදක පාලක මණ්ඩලය (INCB) විසින් සම්මත කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාමාර්ග වේගවත් කිරීමේ සහ ශක්තිමත් කිරීමේ වැදගත්කම ද රජය විසින් පිළිගනු ලබයි.

**මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව කටයුතු කිරීම සහ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම**

මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම පිළිබඳ රටේ ප්‍රතිපත්තිය සහ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අතර අන්තර් සම්බන්ධතාවයක් පැවතීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. එබැවින්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය තුළ ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයන්ට අදාළව පුළුල් ප්‍රවේශයන් යොදා ගන්නා අතර මත්ද්‍රව්‍ය ජාවාරම, දුර්භාවිතය සහ ඒවායේ සෘණාත්මක ප්‍රතිවිපාක වන දරිද්‍රතාවය, සමාජයෙන් කොන්වීම, අසමානතාවය, අපරාධ වර්ධනය වැනි මූලික හේතු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරයි. තවද, එමගින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ඒවාට ගරු කිරීම, අන්තර්ග්‍රාහී ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය, සියලු දෙනාටම ප්‍රතිලාභ ලැබෙන පරිදි පාරිසරික ආරක්ෂණය, නිදහස, සාමය සහ ආරක්ෂාව, නීතියේ ආධිපත්‍යය, යහපාලනය,

DRAFT

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තාවන් සවිබල ගැන්වීම සහ ජාතික තත්ත්වයන් අනුව වෙනස් ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීමේ හා පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියේ ප්‍රතිපත්ති රාමුව තුළ මෙම කරුණු සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත.

**මත්ද්‍රව්‍ය ජාවාරම හා දුර්භාවිතය මැඩලීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම**

රටේ ස්වෛරීභාවයට හා ඒකීයභාවය කෙරෙහි පූර්ණ ගෞරවය සහිතව සහ නීතියේ ආධිපත්‍යය, මානව හිමිකම්, මූලික නිදහස සහ ආත්ම ගරුත්වය මෙන්ම ප්‍රජාවන්ගේ සංස්කෘතික හා සමාජ සම්ප්‍රදායන් ආරක්ෂා කරමින් හා ප්‍රවර්ධනය කරමින් කලාපීය සහ ජාත්‍යන්තර මුලපිරීම් සඳහා සහාය දක්වන අතරතුර මත්ද්‍රව්‍ය ජාවාරම හා දුර්භාවිතය මැඩලීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරමින් මත්ද්‍රව්‍ය ගැටලුවට විසඳුම් ලබා දීමට රජය සිය කැපවීම යළි තහවුරු කරයි. ඒ අනුව, මත්ද්‍රව්‍ය ගැටලුව සහ එහි අහිතකර ප්‍රතිවිපාක මුලිනුපුටා දැමීමටත් සියලු ජනතාවට සුරක්ෂිතභාවය සහ සෞභාග්‍යයෙන් යුතුව ආරක්ෂිතව, සෞඛ්‍ය සම්පන්නව, ගෞරවාන්විතව, සාමකාමීව ජීවත් විය හැකි බව සහතික කිරීම සඳහා මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙන් තොර සමාජයක් ස්ථාපිත කිරීමටත් අවශ්‍ය සියලු පියවර ගැනීමට රජය අධිෂ්ඨාන කර ඇත.

**රජයේ සමස්ත ඉලක්කය**

"මත්ද්‍රව්‍යවලින් තොර රටක් – වඩාත් සෞඛ්‍ය සම්පන්න පුරවැසි ජීවිතයක්" යන ප්‍රතිපත්ති රාමුව තුළ මත්ද්‍රව්‍ය ගැටලුව සම්බන්ධයෙන් රජයේ සමස්ත ඉලක්කය වන්නේ, 2030 වර්ෂය වන විට මත්ද්‍රව්‍ය සැපයුම සහ ඉල්ලුම අවම කිරීමෙන් හා මුලිනුපුටා දැමීමෙන් සුරක්ෂිත හා ආරක්ෂිත රටක් සහ සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීමයි. මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා සුදුසු නියාමන හා ආයතනික ප්‍රතිසංස්කරණ තුළින් ලැබෙන උපායමාර්ගික මගපෙන්වීම් ඔස්සේ මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය සඳහා සෘජුවම සම්බන්ධ වන පාර්ශ්වකරුවන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ ආයතන සහ සියලු පුරවැසියන් ඇතුළු අවසාන අරමුණු සඳහා දායක වීමේ හැකියාව ඇති අනෙකුත් ආයතන විසින් මෙම ඉලක්කය සපුරා ගැනීමට අඛණ්ඩව කටයුතු කරනු ඇත. ජාවාරම්වලට එරෙහිව ඒකාබද්ධ මෙහෙයුම්, ශක්තිමත් කරන ලද දේශසීමා නිරීක්ෂණ, පුළුල් කරන ලද පුනරුත්ථාපනය, මත්ද්‍රව්‍ය වැරදි සඳහා දැඩි හා කඩිනම් යුක්තිය පසිඳලීම, අඛණ්ඩ පාසල් පාදක අධ්‍යාපනය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්යයන් ශක්තිමත් කිරීම සහ රට පුරා විහිදුණු ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් වෙත ප්‍රමුඛතාව ලබා දෙමින් මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් සඳහා වන සිය කැපවීම රජය යළි තහවුරු කරයි.

**පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය**

මත්ද්‍රව්‍ය ගැටලුසම්බන්ධයෙන් පවතින, නව සහ පැන නගින අභියෝග සඳහා ඒකාබද්ධ, බහුශික්ෂණ, අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත්, සමතුලිත, සම්බන්ධීකරණය වූ, විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ සහ පොදු වගකීම් සහිත ක්‍රමෝපායන්ගෙන් සමන්විත යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මගින් විසඳුම් ලබා දිය යුතු බව රජය විසින් හඳුනාගෙන ඇත.

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, අධිකාරී, පළාත් සභා, පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සහ ඒවායේ ක්ෂේත්‍ර මට්ටමේ ආයතන මෙන්ම රජයේ සංවිධාන යටතට ගැනෙන අනෙකුත් සියලුම ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ පෞද්ගලික අංශයේ ආයතන සහ සියලුම පුරවැසියන්, මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීමේ හා පාලනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අනුගත විය යුතු අතර ශක්තිමත් හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරමින් මෙම ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරී හවුල්කරුවන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වන ඵලදායී ප්‍රවේශය**

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටලුවට ඵලදායීව විසඳුම් ලබා දීම සඳහා ඇති ප්‍රධාන ප්‍රවේශයන් දෙක වන්නේ, සැපයුම පාලනය සහ ඉල්ලුම අවම කිරීමයි. මත්ද්‍රව්‍ය ගැටලඅව සඳහා වඩාත්ම ඵලදායී ප්‍රවේශය, සැපයුම පාලනය සහ ඉල්ලුම අවම කිරීම අන්‍යොන්‍ය වශයෙන් ශක්තිමත් කරන පුළුල්, සමතුලිත හා සම්බන්ධීකරණය වූ විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ ක්‍රමෝපාය සමග සැපම පාලනය හා ඉල්ලුම අවම කිරීම එකිකෙ මතශක්තිමත් කරන පොදු වගකීම පිළිබඳ ඉහළ හැඟීමක් සහිත ප්‍රජා, ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාව වැඩිදියුණු කිරීම අවධාරණය කර ඇත.

# ඉලක්කය

මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීමේ හා පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණ වන්නේ, 2030 වර්ෂය වන විට මත්ද්‍රව්‍ය සැපයුම සහ ඉල්ලුම අවම කිරීමෙන් හා මුලිනුපුටා දැමීමෙන් සුරක්ෂිත හා ආරක්ෂිත රටක් සහ සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීමයි.

# අරමුණු

- නීතිවිරෝධී ලෙස මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම සහ භාවිතයට එරෙහිව නීති කාර්යක්ෂමව බලාත්මක කිරීම තුළින් රටට මත්ද්‍රව්‍ය ඇතුළු වීම වැළැක්වීම සහ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව නැති කර දැමීම.
- ඵලදායී නියාමන ක්‍රියාමාර්ග මගින් මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය, පූරෝගාමී රසායනික, ඖෂධ සහ නව මනෝ ක්‍රියාකාරී ද්‍රව්‍ය (NPS) අපහරණය වැළැක්වීම.
- මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා ආරක්ෂණ සාධක ශක්තිමත් කිරීම, අවදානම් සාධක ඉවත් කිරීම, මත්ද්‍රව්‍ය සඳහා කෘත්‍රිමව නිර්මාණය කරන ලද ඉල්ලුමෙහි ආකර්ෂණය බිඳ හෙළීම ඇතුළුව විශේෂයෙන්ම ළමුන්, තරුණ තරුණියන්, කාන්තාවන්, ප්‍රජාවන්, අවදානම් තත්ත්වයන්හි සිටින ජනතාව සහ සියලු පුරවැසියන් කෙරෙහි අවධානය යොමු කරමින් වැරදිසහගත මිත්‍යා මත අභියෝගයට ලක් කිරීම සහ මත්ද්‍රව්‍යවල ආකර්ෂණීය ප්‍රතිරූපය ඉවත් කිරීම.
- මත්ද්‍රව්‍ය භාවිතයේ අහිතකර සෞඛ්‍ය ප්‍රතිවිපාක සම්බන්ධයෙන් කටයුතු කරමින් මත්ද්‍රව්‍ය භාවිත කරන සියලුම පුද්ගලයන් සඳහා ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ රැකවරණය සේවා සඳහා ප්‍රවේශය සහතික කිරීම.
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමින් ආයතන අතර සහ ආයතන තුළ වැඩි සම්බන්ධීකරණයක් සහ සහයෝගීතාවයක් සහතික කිරීම.
- මත්ද්‍රව්‍යවලින් තොර රටක් ස්ථාපිත කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන ආයතන, සිවිල් සමාජ, ප්‍රජාවන් සහ පුරවැසියන් සවිබල ගැන්වීම.
- විද්‍යාත්මක හා සාක්ෂි මත පදනම් වූ තොරතුරු කළමනාකරණය, පර්යේෂණ සහ අධීක්ෂණය හා ඇගයීමේ ක්‍රියාවලිය සහතික කිරීම.

DRAFT

## ප්‍රතිපත්තිය

මත්ද්‍රව්‍ය දූර්භාවිතය, නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය, ක්‍රියාත්මක කිරීමේ ආයතන සඳහා මාර්ගෝපදේශයක් ලෙසත්, එකම උපාය මාර්ගය මත ක්‍රියා කරන විවිධ ආයතන ඒකාබද්ධ කිරීමේ සහ සම්බන්ධීකරණයේ යාන්ත්‍රණයක් ලෙසත්, උපදේශනය සඳහා වන පදනමක් ලෙසත් සැලකිය යුතුය.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්තිමය අංග සහ එම අංග යටතේ ගැනෙන ප්‍රතිපත්ති පහත පරිදි වේ;

### I. ඉල්ලුම අඩු කිරීම

<u>**ප්‍රතිපත්ති අංක 01**</u> - සාක්ෂි මත පදනම් වූ නිවාරණය, ප්‍රතිකාර සහ ප්‍රතිසාධන පද්ධති හරහා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය දූර්භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම.

### II. මත්ද්‍රව්‍ය සැපයුම පාලනය කිරීම

<u>**ප්‍රතිපත්ති අංක 02**</u> - මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, වගාව, ජාවාරම් කිරීම, ප්‍රවාහනය සහ රසායනික ද්‍රව්‍ය හා පාලිත ඖෂධ අපහරණය සම්බන්ධයෙන් නීතිය ඵලදායීව බලාත්මක කිරීම.

<u>**ප්‍රතිපත්ති අංක 03**</u> - පාලනයට ලක් කර ඇති ඖෂධ සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදා හැරීම ඵලදායීව අධීක්ෂණය කිරීම.

### III. සම්බන්ධීකරණය සහ සහයෝගීතාව

<u>**ප්‍රතිපත්ති අංක 04**</u> - මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීම සහ පාලනයට අදාළ කලාපීය සහ ජාත්‍යන්තර මුලපිරීම් සඳහා සහාය වීම.

## ප්‍රතිපත්ති සාරාංශය

**ප්‍රතිපත්ති අංක 01 -**
**මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය දූර්භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම**

### 1.1 නිවාරණය, අධ්‍යාපනය සහ පුහුණුව

මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැළැක්වීමට අදාළ සියලුම අංශ නිවාරණය පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව මෙම ප්‍රතිපත්ති සාරාංශය මගින් ආවරණය කරනු ලැබේ. එමගින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය, දූර්භාවිතයට හැකියාවක් ඇති නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය/ ද්‍රව්‍ය භාවිතය, මෙන්ම මනෝ ක්‍රියාකාරී බලපෑම් සහිත නීත්‍යානුකූලව ලබාගත් මත්ද්‍රව්‍ය භාවිතය ඇතුළු සියලුම ආකාරයේ මත්ද්‍රව්‍ය දූර්භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය.

1.1.1 නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය භාවිතය (නීත්‍යානුකූල දුම්කොළ නිෂ්පාදන සහ නීත්‍යානුකූල මද්‍යසාර නිෂ්පාදන) සහ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය සියලුම මට්ටම්වලදී අධෛර්යමත් කළ යුතුය.
1.1.2 සියලුම ආකාරයේ මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය අධෛර්යමත් කරනු ලැබේ.
1.1.3 පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතන, නිෂ්පාදන කර්මාන්තශාලා, රාජ්‍ය සහ පෞද්ගලික සේවා සපයන්නන්, ආරක්ෂක සේවා සපයන ආයතන, සේවා ස්ථාන, වතුප්‍රජාවන්, කාර්මික ආයතන, ප්‍රවාහන අංශ සහ සෞඛ්‍ය සේවා සපයන්නන් වැනි විශාල

ආයතන මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීමට අදාළව සිය ආයතනික ආචාර ධර්ම සංග්‍රහයක් සහ ආයතනික භාවිතාවන් පවත්වාගෙන යනු ඇත.

1.1.4 පාසල්වල මත්ද්‍රව්‍ය සම්බන්ධ සිදුවීම් කළමනාකරණය සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි දඬුවම් නොදෙන සුළු විය යුතු අතර සාක්ෂි මත පදනම් විය යුතුය.

1.1.5 සියලුම ආකාරයේ මනෝ ක්‍රියාකාරී මත්ද්‍රව්‍ය පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ තොරතුරු අධ්‍යාපන ආයතන සහ තොරතුරු මූලාශ්‍ර වෙත ලබා දෙනු ඇත.

1.1.6 මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ හෙළා දැකීම රජයේ සහ පෞද්ගලික මාධ්‍ය ආයතන විසින් මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික සහ සමාජ මාධ්‍ය ප්‍රකාශන හා වැඩසටහන්වලදී අනුගමනය කරන නිවාරණ ප්‍රතිපත්තිය වනු ඇත.

1.1.7 මත්ද්‍රව්‍ය දුර්භාවිතයට අදාළ කරුණු වාර්තා කිරීමේදී ප්‍රවර්ධනයක් නොවන ආකාරයට කටයුතු කිරීම සඳහා මාධ්‍ය ආයතන තමන්ගේම ආචාර ධර්ම සංග්‍රහයන් පවත්වාගෙන යාමට දිරිමත් කරනු ලැබේ.

1.1.8 මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ අහිතකර බලපෑම් ඉස්මතු කරන නිවාරණ පණිවුඩ ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය ආයතන හැකි සෑම පියවරක්ම ගත යුතුය.

1.1.9 නිවාරණය සඳහා මත්ද්‍රව්‍යවලට විශේෂිත නොවන ප්‍රවේශයන් දිරිමත් කරනු ලැබේ.

1.1.10 සියලුම කණ්ඩායම් සහ මහජනතාව ඇතුළත් කාණ්ඩ සම්බන්ධ කර ගන්නා, මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අන්තර්ග්‍රාහී සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි දැනුම සහතික කරන, දැනුවත් කිරීමේ සහ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

1.1.11 ගර්භනී කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මුල් සංවර්ධන අවධීන්ට සහාය වීම පිණිස මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

1.1.12 මව්වරුන් සහ දියණියන් සවිබල ගැන්වීම ඇතුළු විශේෂිත කණ්ඩායම් ඉලක්ක කරගත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වැඩසටහන් පැවැත්වීම හෝ මැදිහත්වීම් සිදු කිරීම දිරිමත් කරනු ලැබේ.

1.1.13 පවුල් ශක්තිමත් කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතයට හා අවදානම් සහගත හැසිරීම්වලට එරෙහි ආරක්ෂණ සාධක වර්ධනය කිරීම සඳහා දෙමාපිය සහ පවුල් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

1.1.14 සියලුම අධ්‍යාපන ආයතන (පාසල්, කර්මික විද්‍යාල, විශ්වවිද්‍යාල), තරුණ සේවා ආයතන සහ වෙනත් තරුණ සංවිධාන මගින් තරුණයන් විසින් අවදානම් ගැනීම අඩු කිරීම සඳහා ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාවන්, අභියෝග කළමනාකරණය කිරීමේ හැකියාවන්, ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවන්, සන්නිවේදන සහ නායකත්ව හැකියාවන් මෙන්ම ආධ්‍යාත්මික සහ සදාචාරාත්මක වටිනාකම් වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.1.15 තරුණයන්/ශිෂ්‍යයන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන, තරුණ කේන්ද්‍රීය හෝ ශිෂ්‍ය කේන්ද්‍රීය මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් බොහෝ සෙයින් දිරිමත් කරනු ලැබේ.

1.1.16 වෛද්‍ය පීඨ/වෛද්‍ය විද්‍යාල, හෙද පුහුණු පාසල් සහ අනෙකුත් සෞඛ්‍ය පුහුණු ආයතන විසින් සිසුන්ට මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා (SUDs) කළමනාකරණය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා දෙනු ඇත.

1.1.17 දුම්කොළ හා මද්‍යසාර කර්මාන්තය මෙන්ම නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වෙළඳපොළ විසින් යොදනු ලබන උපාය මාර්ග පිළිබඳව නව යෞවනයන් දැනුවත් කරන ආකාරය වැඩසටහන් අන්තර්ගතයෙහි ඇතුළත් විය යුතුය.

1.1.18 පාසල් පද්ධතියේ සියලුම සිසුන් වෙත ඵලදායී නිවාරණ පණිවුඩ ලබා දෙන බව සහ මැදිහත්වීම් සිදු කෙරෙන බව සහතික කළ යුතුය.

1.1.19 පාසල් අධ්‍යාපන පද්ධතියේ සියලුම ශ්‍රේණි සඳහා වන මැදිහත්වීමේ වැඩසටහන් තුළ ප්‍රමිතිගත විෂය මාලා සහ අන්තර්ක්‍රියාකාරී ස්වභාවයේ ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සහතික කරයි.

1.1.20 පාසල්, පවුල් සහ ප්‍රජාව ඉලක්ක කර ගත් සංරචක කිහිපයකින් සමන්විත ප්‍රජා පාදක මුලපිරීම් සිදු කිරීමට දිරිමත් කරනු ලැබේ.

1.1.21 මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා බිම් මට්ටමේ රාජ්‍ය සේවකයන්, ප්‍රජා පාදක සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන සම්බන්ධ කර ගැනීම සහතික කරනු ලැබේ.

1.1.22 නිවාරණ වැඩසටහන් විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ, සංවර්ධනාත්මකව සුදුසු, අනුක්‍රමික, සන්දර්භයට ගැළපෙන සහ රජයේ ආයතනයක් හෝ විශේෂඥ කමිටුවක් මගින් ප්‍රතීතනය කරන ලද හෝ නියාමනය කරන ලද ඒවා බව සහතික කරනු ලැබේ.

1.1.23 රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන සහ ස්වේච්ඡා සේවකයන් සඳහා ධාරිතා සංවර්ධන අවස්ථාවන් සහ තාක්ෂණික සහාය සපයනු ලබන අතර එමගින් ඔවුන්ට මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වැඩි දායකත්වයක් ලබා දිය හැකිය.

1.1.24 මත්ද්‍රව්‍ය නිවාරණයේ දී පළාත් ආයතනවල ධාරිතා සංවර්ධනයට ප්‍රමුඛතාව දෙනු ලබන අතර සෑම පළාත් සභාවක්ම මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වෙන් වූ ඒකකයක් පවත්වාගෙන යන බව සහතික කරනු ලැබේ.

1.1.25 මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ සියලුම අංශ සම්බන්ධයෙන් වන වසංගතවේදී, සමාජයීය සහ විද්‍යාත්මක පර්යේෂණ දිරි ගන්වනු ලැබේ.

1.1.26 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලට එච්අයිවී/ඒඩ්ස් සහ ක්ෂය රෝග නිවාරණ සංරචක ඇතුළත් වනු ඇති අතර ස්වේච්ඡාවෙන් පරීක්ෂා කර ගැනීම කෙරෙහි දිරිමත් කරනු ඇත.

1.1.27 ඵලදායීතාව සහතික කිරීම සහ වැඩිදියුණු කළ මුලපිරීම් සිදු කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වල ප්‍රතිඵල නිරතුරුව ඇගයීමට ලක් කරනු ලැබේ.

1.1.28 නිවාරණ වෘත්තිකයන් විසින් ශාස්ත්‍රීය හා වෘත්තීය ප්‍රමිතීන්, විනය සහ සදාචාරාත්මක පිළිවෙත් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් සුදුසු පියවර ගත යුත්තේය.

1.1.29 සෞඛ්‍ය, අධ්‍යාපන, සුබසාධන සහ සමාජ සේවා සපයන්නන්, අදාළ බිම් මට්ටමේ රාජ්‍ය සේවකයන්, ප්‍රජා නායකයන්, ආගමික නායකයන් සහ ස්වේච්ඡා සේවකයන් ඉලක්ක කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ සුදුසු පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය.

1.1.30 නිවාරණ වැඩසටහන් පැවැත්වීම සහ කෙටි මැදිහත්වීම් සිදු කිරීම සඳහා පාසල් මට්ටමින්, ප්‍රජා මට්ටමින් සහ තෝරාගත් වෘත්තීන්ට අයත් පහසුකම් සපයන්නන්ගේ හැකියාවන් වර්ධනය කළ යුතුය.

1.1.31 සෑම පළාත් සභාවක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය සඳහා වෙන් වූ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා පවත්වාගෙන යනු ඇත.

### 1.2 මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය

මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයන් සඳහා ප්‍රමිතිගත ප්‍රතිකාර සේවා වෙත ප්‍රවේශය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. සාක්ෂි මත පදනම් වූ පුළුල් පරාසයක පැතිර පවත්නා ප්‍රතිකාර ක්‍රම, එනම් නේවාසික ප්‍රතිකාර, බාහිර සේවාවන්, බාහිර රෝගී සායන, ප්‍රජා පාදක ප්‍රතිකාර සහ වෙනත් චිකිත්සාවන් සහ සේවාවන් මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන්ගේ අවශ්‍යතා අනුව යොදා ගත යුතුය.

1.2.1 මධ්‍යම රජයේ, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල අදාළ රජයේ බලධාරීන් විසින් ඔවුන්ගේ අදාළ ප්‍රදේශවල මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයන්ට සහ ඔවුන්ගේ

DRAFT

පවුල්වලට ප්‍රමාණවත් උපදේශන සහ ප්‍රතිකාර සේවා (නේවාසික, ප්‍රජා පාදක සහ වෙනත්) ලබා ගත හැකි බවට වගබලා ගනු ඇත.

1.2.2 සියලුම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා එක් තනි ප්‍රතිකාර ක්‍රමයක් සුදුසු නොවේ. එබැවින් ප්‍රතිකාර ප්‍රමිතීන්ට අනුකූලව විවිධ දේශීය සංස්කෘතික සාධක සැලකිල්ලට ගනිමින් රජය විසින් පිළිගත හැකි, සාක්ෂි මත පදනම් වූ විවිධ ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දීමට දිරිමත් කරනු ලැබේ.

1.2.3 උපදේශනය (තනි පුද්ගල සහ/හෝ කණ්ඩායම්) සහ අනෙකුත් චර්යාවාදී චිකිත්සාවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා වන ඵලදායී ප්‍රතිකාරයේ තීරණාත්මක අංග වේ. සියලුම ප්‍රතිකාර ක්‍රමවලට එවැනි සංරචක ප්‍රමාණවත් ලෙස ඇතුළත් වනු ඇත.

1.2.4 වඩාත් ඵලදායී ලෙස මෙම ක්‍රියාවලිය සිදු කරගෙන යෑම සඳහා වෛද්‍යාමය මැදිහත්වීම්, උපදේශනය සහ වෙනත් චර්යාමය මැදිහත්වීම් සමග ඒකාබද්ධ කරනු ඇති අතර උපදේශනය සහ චාර්යා චිකිත්සක අංග ප්‍රතිකාර වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන ආයතන දිරිමත් කරනු ලැබේ.

1.2.5 බහුශික්ෂණ ප්‍රතිකාර කණ්ඩායමක් විසින් මත්ද්‍රව්‍ය ප්‍රතිකාරය සඳහා බහුශික්ෂණ ප්‍රවේශයක් සහතික කරනු ඇත.

1.2.6 අඛණ්ඩ මනෝ-සමාජයීය මැදිහත්වීම් මගින් ඵලදායී ප්‍රතිකාර ක්‍රියාවලියක් සහතික කරනු ඇත.

1.2.7 සුවවීමේ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා සාක්ෂි මත පදනම් වූ උපාය මාර්ගයක් ලෙස සතිමත්භාවය පදනම් කරගත් ප්‍රවේශයන් මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා වන ප්‍රතිකාරයට ඒකාබද්ධ කළ යුත්තේය.

1.2.8 සියලුම ප්‍රතිකාර වැඩසටහන් මානුෂීය, පිරිවැය-ඵලදායී, ප්‍රවේශ විය හැකි සහ දිගුකාලීනව ප්‍රතිකාර සේවා සපයන්නන්ට මෙන්ම සේවාලාභීන්ට දැරිය හැකි වනු ඇත.

1.2.9 පසුරැකවරණ සහ පුනරුත්ථාපන සංරචක සියලුම ප්‍රතිකාර මැදිහත්වීම් සඳහා අත්‍යවශ්‍ය අංග ලෙස සලකනු ලැබේ.

1.2.10 සේවාලාභීන්ගේ/රෝගීන්ගේ පවුලේ සාමාජිකයන්ට මනෝ-සමාජයීය සහාය ඇතුළු අවශ්‍ය සේවා සැපයීම දිරිමත් කරනු ලැබේ.

1.2.11 ප්‍රතිකාර වැඩසටහන් මගින් එච්අයිවී/ඒඩ්ස්, වෙනත් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග, හෙපටයිටිස් B සහ C, ක්ෂය රෝගය සහ වෙනත් රුධිරය හරහා බෝවන ආසාදන තක්සේරු කරනු ඇත. තමන්ට හෝ අන් අයට ආසාදන අවදානමක් ඇති කරන හැසිරීම් වෙනස් කිරීමට රෝගීන්ට උපකාර කිරීම සඳහා ඔවුන්ට උපදේශනය සපයනු ඇත.

1.2.12 ප්‍රතිකාර ලබා දීමේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පවත්වා ගැනීමට ප්‍රතිකාර සේවා සපයන්නන් දිරිමත් කරනු ලැබේ.

1.2.13 පුනරුත්ථාපනය වූ සේවාලාභීන්ට සහාය වීම සඳහා සියලු පාර්ශ්වකරුවන් ඇතුළත් වන, සම්බන්ධීකරණය වූ පසු විපරම් පද්ධති සංවර්ධනය කිරීමට දිරි ගන්වනු ලැබේ.

1.2.14 ප්‍රතිකාර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රමිතිගත ස්වයං උපකාර කණ්ඩායම් සහ වෙනත් හැකි ක්‍රම හරහා නැවත භාවිතයට යොමුවීම වැළැක්වීමේ වැඩසටහන් සකස් කරනු ඇත.

1.2.15 ව්‍යුහගත ප්‍රතිකාර ක්‍රමවලට යොමු වීමට අභිප්‍රේරණය නොවූ රෝගීන් වෙත ළඟා වීම සහ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පහසුකම් සපයන බාහිරසේවා මැදිහත්වීම් සහතික කරනු ඇති අතර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ සෞඛ්‍ය හා සමාජයීය ප්‍රතිවිපාක වැළැක්වීම සඳහා විස්තීර්ණ ක්‍රියාමාර්ග මාලාවක් ගනු ඇත.

1.2.16 මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් සෑම විටම අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයන් සහතික කරනු ඇති අතර අමානුෂික හෝ අවමන් සහගත භාවිතයන් සහ දඬුවම් කිසි විටෙකත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ ප්‍රතිකාරයේ කොටසක් නොවන බවට අදාළ සියලුම බලධාරීන් සහතික විය යුත්තේය.

DRAFT

1.2.17 රජය, පෞද්ගලික අංශ සහ නාමකරණය කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇතුළු ප්‍රතිකාර සේවා සපයන්නන් අදාළ රෙගුලාසි මගින් නියම කර ඇති අවම ප්‍රමිතීන් පවත්වා ගත යුතුය.

1.2.18 රෝගීන්ගේ/සේවාලාභීන්ගේ අවශ්‍යතා අනුව සහ නියමිත වේලාවට ප්‍රතිකාර ලබා දීම සහතික කළ යුත්තේය.

1.2.19 මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලන ස්වේච්ඡා ප්‍රතිකාර සේවා වෙත ප්‍රවේශය සෑම විටම දිරිමත් කරනු ලබන අතර සේවාවන් සහ ප්‍රතිකාර ලබා දෙන ආයතන වෙත ප්‍රවේශ වීමේදී වෙනස් කොට සැලකීමක් සිදු නොකරන බවට සහතික කරනු ඇත.

1.2.20 ප්‍රජා පාදක ප්‍රතිකාර සේවා සහ බාහිර සේවා සංවර්ධනය කිරීමට රජය සහ රාජ්‍ය නොවන සංවිධාන දිරිමත් කරනු ලැබේ.

1.2.21 මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයන් සඳහා මූලික සත්කාරයේ සිට තෘතීයික සත්කාර මට්ටම දක්වා බාහිර රෝගී ප්‍රතිකාර ඒකක වලදී ප්‍රතිකාර ලබා දීමට සෞඛ්‍ය බලධාරීන් දිරිමත් කරනු ලැබේ.

1.2.22 කායික තත්ත්වයන්, මානසික තත්ත්වයන් හෝ පූර්ව ප්‍රතිකාර අත්දැකීම් ඇතුළු විවිධ තත්ත්වයන් සහිත පුද්ගලයන්ට විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ වර්ගීකරණය මත ප්‍රතිකාර සේවාවන් ලබා ගැනීමේ හැකියාව තිබිය යුතුය.

1.2.23 ප්‍රතිකාර සපයන වෘත්තිකයන් විසින් විශේෂිත ජංගම සේවා, දුරකථන සහ මාර්ගගත උපදේශන සේවා හරහා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් වෙත ඵලදායී හා කාර්යක්ෂම සහාය සේවාවන් ලබා දීම සහතික කරනු ඇත.

1.2.24 අවමානයට පැමිණවීම සහ වෙනස් කොට සැලකීම මග හරිමින් ප්‍රතිකාර සේවාවන් වෙත ප්‍රවේශ වීමට හැකි විය යුතුය.

1.2.25 කාන්තාවන්, ළමුන් රැකබලා ගැනීමේ අවශ්‍යතාවන් සපුරාලමින් ගර්භනී මව්වරුන්, තරුණ තරුණියන් සහ ළමුන් ඇතුළු විශේෂිත ජනගහන කණ්ඩායම් සඳහා ඔවුන්ගේ සුවිශේෂී තත්ත්වයන්ට ගැලපෙන පරිදි සහාය ලබා දීමට ප්‍රතිකාර සේවාවන් සහතික කරනු ලැබේ.

1.2.26 අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, සෞඛ්‍ය බලධාරීන් සමග සම්බන්ධීකරණයෙන් රටේ ප්‍රතිකාර සේවාවේ නිසි ක්‍රියාකාරිත්වය සහ ප්‍රතිකාර සේවා පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති, රෙගුලාසි, අත්පොත්, මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටි සකස් කර සමාලෝචනය කරනු ඇත.

1.2.27 ප්‍රතිකාර සේවා සපයන්නන්, ප්‍රතිකාර සපයන වෘත්තිකයන් සහ අනෙකුත් අදාළ කාර්ය මණ්ඩලය අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් අදාළ බලධාරීන් විසින් සකස් කර ප්‍රවර්ධනය කළ යුතුය.

1.2.28 මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ සුදුසු ප්‍රතිකාර වැඩසටහන් වෙත යොමු කිරීම සඳහා දිවයින පුරා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

1.2.29 රෝග විනිශ්චය සහ ප්‍රතිකාර අරමුණු සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් හඳුනා ගැනීමට මත්ද්‍රව්‍ය අනාවරණ පරීක්ෂණ පහසුකම් රෝහල් පද්ධතිය තුළ ස්ථාපිත කළ යුතුය.

1.2.30 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා දායක වීමට රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන තුළ ධාරිතා සංවර්ධනය දිරිමත් කරනු ලැබේ.

1.2.31 අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් රාජ්‍ය අංශයේ ආයතන, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අය විසින් සපයනු ලබන ප්‍රතිකාර සේවාවන් අධීක්ෂණය කරනු ඇත.

1.2.32 මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සහ කලින් භාවිත කළ පුද්ගලයන් වගකීම් සහ බැඳීම් සහිත සාමාන්‍ය පුද්ගලයන් ලෙස සලකා අවමානය අවම කරමින් ඔවුන් නැවත සමාජගත කිරීම දිරිගන්වනු ලැබේ.

DRAFT

1.2.33 අධීක්ෂණය සහ ඇගයීම් පද්ධති යනු සෑම ඉල්ලුම අඩු කිරීමේ යාන්ත්‍රණයකම මූලික අංගය වේ.

1.2.34 බන්ධනාගාර සහ විශේෂිත ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ දී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා වූ ප්‍රතිකාර ලබා ගත හැකි විය යුතුය.

**ප්‍රතිපත්ති අංක 02 -**
**මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, වගාව, නීතිවිරෝධී ප්‍රවාහනය, ජාවාරම් කිරීම සහ රසායනික ද්‍රව්‍ය හා ඖෂධ අපහරණයට එරෙහිව නීතිය ඵලදායීව බලාත්මක කිරීම.**

මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පූරෝගාමී රසායනික ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ලබා ගැනීමේ හැකියාව අඩු කිරීම සඳහා නීතිය දැඩිව බලාත්මක කිරීම අත්‍යාවශ්‍ය වන අතර ඒ සමගම වෛද්‍ය සහ විද්‍යාත්මක කටයුතු සඳහා ඒවායේ අවශ්‍යතාවයද තහවුරු කළ යුතුය.

2.1 සෞඛ්‍ය බලධාරීන් විසින් වලංගු වෛද්‍ය සහ විද්‍යාත්මක කටයුතු සඳහා පාලිත මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රවේශය සහතික කරනු ඇත. එමෙන්ම, ඒවා දූර්භාවිතය සහ අපසරණය වැළැක්වීම සඳහා බලධාරීන් විසින් ඵලදායී ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ඇත.

2.2 අදාළ සියලුම නීති බලාත්මක කිරීමේ ආයතන විසින් මත්ද්‍රව්‍ය ජාවාරම සහ රට තුළ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව අවම කිරීම සඳහා උත්සාහ කරනු ඇත. මත්ද්‍රව්‍ය නීති බලාත්මක කිරීමේ බලපෑම මනිනු ලබන්නේ බිම් මට්ටමේ මත්ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව අනුවය.

2.3 රටට ඇතුළු වන සියලුම පිවිසුම් ස්ථානවල රේගු දෙපාර්තමේන්තුව යටතේ වන වඩාත් ඵලදායී මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ සහ වැළැක්වීමේ පද්ධති පවත්වාගෙන යනු ඇති අතර රජය එකඟ වන ජාත්‍යන්තර සම්මුතිවල අවශ්‍යතා සපුරාලනු ඇත.

2.4 ඵලදායී මත්ද්‍රව්‍ය පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා පවතින නීති, රෙගුලාසි සහ භාවිතයන් සමාලෝචනය කිරීමට සහ වෙනස් කිරීමට නීති බලාත්මක කිරීමේ ආයතන විසින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ඵලදායීව භාවිත කරනු ඇත.

2.5 උද්ගතවන ප්‍රවණතාවලට එරෙහිව කටයුතු කිරීම මෙන්ම නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වෙළඳපොළේ ඇති සංකීර්ණතා සහ විවිධත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව නීති පැනවීම සහ පවතින නීති හා රෙගුලාසිවලට සංශෝධන සිදු කරනු ඇත.

2.6 නීති සම්පාදනය කිරීමේදී හෝ සංශෝධනය කිරීමේදී එක්සත් ජාතීන්ගේ අදාළ ආදර්ශ නීති සහ රජය විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුති සහ මාදක ඖෂධ පිළිබඳ කොමිෂන් සභාව (CND) හා ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය (INCB) විසින් සම්මත කරන ලද ප්‍රතිපත්ති ලේඛන සහ යෝජනා නිසි ලෙස සැලකිල්ලට ගනු ඇත.

2.7 නීති බලාත්මක කිරීමේ ආයතනයන්හි සියලුම මට්ටම්වල මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය අදාළ ආයතනයේ ප්‍රධානියා විසින් පිළිගනු ඇත.

2.8 මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ නව මනෝ ක්‍රියාකාරී ද්‍රව්‍ය (NPS) නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය, ජාවාරම් කිරීම සහ අපසරණය අධීක්ෂණය කිරීම, හඳුනාගැනීම සහ ඒවා නතර කිරීම සඳහා නීති බලාත්මක කිරීමේ ආයතන සහ අදාළ ආයතන වෙත ඉලක්කගත පුහුණුවක් සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණ සපයනු ඇත.

2.9 නීති බලාත්මක කිරීමේ ආයතනවල සේවකයන් හෝ සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන් විසින් විය හැකි මත්ද්‍රව්‍ය දූර්භාවිතය සම්බන්ධයෙන් නීති බලාත්මක කිරීමේ ආයතන සහ

DRAFT

ආරක්ෂක අංශ තමන්ගේ ආයතනික රාමුව තුළ සිය චර්යා ධර්ම සංග්‍රහයන් පවත්වා ගනු ඇත.

2.10 නීති බලාත්මක කිරීමේ ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා නිසි ඇගයීම් සහ ත්‍යාග පිරිනැමීමේ යාන්ත්‍රණ හඳුන්වා දෙනු ඇත. පුහුණුව ලද සහ කාර්යක්ෂම නිලධාරීන් වෙනත් අංශවලට යළි අනුයුක්ත කිරීම වැළැක්වීම සඳහා ස්ථාන මාරු යෝජනා ක්‍රම සංශෝධනය කරනු ඇත.

2.11 මත්ද්‍රව්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සපයන පුද්ගලයන් සඳහා දැඩි රහස්‍යභාවය සහ ආරක්ෂාව සහතික කරමින් මූල්‍ය ත්‍යාග පිරිනැමීමේ ක්‍රමයක් ස්ථාපිත කරනු ඇත.

2.12 මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු කඩිනමින් විභාග කිරීම සඳහා, නව භාණ්ඩ වන මත්ද්‍රව්‍ය ආරක්ෂිතව හැසිරවීම සහ සාක්ෂි ලෙස අධිකරණ වෙත ඉදිරිපත් කෙරෙන මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා සම්මත ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීමට සහ දඬුවම් නියම කිරීමේ දී ඇති විෂමතා අවම කිරීමට අධිකරණය සහ අනෙකුත් අදාළ රජ්‍ය ආයතන අවශ්‍ය පියවර ගනු ඇත.

2.13 මත්ද්‍රව්‍ය සමාජයට නැවත ඇතුළු නොවන බවට වගබලා ගැනීම සඳහා දැඩි අධීක්ෂණයක් සහිතව, අධිකරණයට ඉදිරිපත් කළ හෝ නීති බලාත්මක කිරීමේ බලධාරීන් විසින් අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව, පරිසර හිතකාමී ලෙස විනාශ කිරීම සඳහා රජය විසින් ප්‍රමිතිගත යාන්ත්‍රණයක් ස්ථාපිත කර බලාත්මක කරනු ඇත.

2.14 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපකරණ, අවශ්‍ය සේවක සංඛ්‍යාව සහ පුහුණු යෝජනා ක්‍රමවලින් සමන්විත කරනු ඇත. එසේම මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා පහසුකම් සැපයීමට, වෙනත් රසායනාගාරවල විශ්ලේෂණ පහසුකම් සංවර්ධනය කිරීම සහ භාවිත කිරීම සිදු කළ යුතු වේ.

2.15 දැනට පවතින නීති බලාත්මක කිරීම සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම තුළින් ගංජා සහ අනෙකුත් ශාක පදනම් කරගත් මත්ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස වගා කිරීම, නිෂ්පාදනය සහ ජාවාරම් කිරීම වැළැක්වීමට, නැවැත්වීමට සහ එයට එරෙහිව සටන් කිරීමට නීති බලාත්මක කිරීමේ ආයතන සහ අදාළ රාජ්‍ය ආයතන ඵලදායී ක්‍රියාමාර්ග ගනු ඇත.

2.16 නීති බලාත්මක කිරීමේ ආයතනවල සහාය ඇතිව ආයුර්වේද දෙපාර්තමේන්තුව ගංජා සහ කංසා අඩංගු ආයුර්වේද නිෂ්පාදන නීතිවිරෝධී ලෙස සකස් කිරීම ඵලදායීව නවත්වනු ඇත.

2.17 අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය හරහා සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ක්‍රියා කිරීම සඳහා විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණයට අදාළ බලධාරීන් සහ අදාළ සියලුම ආයතන අතර සහයෝගීතා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය වේ.

2.18 අන්තර්ජාලය සහ තැපැල් මගින් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධයෙන් ඵලදායීව කටයුතු කිරීම සඳහා ජාතික මට්ටමේ නෛතික සහ පරිපාලන පද්ධති තුළ කාලෝචිත, විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ පාලන හා නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහතික කරනු ඇත.

2.19 පාලිත මත්ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීම අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහ තැපැල් සේවාව හරහා සංසරණය වන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය තොග හඳුනා ගැනීම සඳහා නවීන තාක්ෂණික මෙවලම් හරහා නීති බලාත්මක කිරීමේ හැකියාව වැඩි දියුණු කරනු ඇත.

2.20 ජාතික සහ ජාත්‍යන්තර අපරාධ ජාලයන්ට එරෙහිව සටන් කිරීම සඳහා නිවැරදි බුද්ධි තොරතුරු ක්‍රමානුකූලව රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ සුරක්ෂිතව බෙදා හැරීම කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ඇත.

2.21 එල්ල වන අභියෝග සඳහා මෙහෙයුම් ප්‍රතිචාර දැක්වීමට සහාය වීම, විද්‍යාත්මක තොරතුරු සහ වඩාත් ඵලදායී භාවිතයන් හුවමාරු කර ගැනීම පිණිස විද්‍යාත්මක ක්ෂේත්‍රයේ වෘත්තිකයන්, ජාතික රසායනාගාර සහ නීති බලාත්මක කිරීමේ ආයතන අතර සහයෝගීතාවය ශක්තිමත් කරනු ලැබේ.

2.22 උද්ගත වන ප්‍රවණතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන් කිරීම සඳහා මත්ද්‍රව්‍ය නීති බලාත්මක කිරීමේ ආයතන සහ අනෙකුත් අදාළ ආයතනවල ධාරිතාවය ඉහළ නංවනු ඇත.

2.23 මුහුදු මාර්ගයෙන් සිදු කෙරෙන මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා ඉන්දියානු සාගරයේ පිහිටි රටවල් සමග ශක්තිමත් සහ වැඩිදියුණු කළ සම්බන්ධීකරණයක් හා සහයෝගීතාවයක් සහිත අඛණ්ඩ අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ.

2.24 මුහුදු මාර්ගයෙන් එල්ල විය හැකි සියලු මත්ද්‍රව්‍ය ජාවාරම් තර්ජනවලට මුහුණ දීම සඳහා නෞකා ගමනාගමනය සහ හුවමාරුවීම් ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීම සහ සමුද්‍රීය මුර සංචාර සහ අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම් සිදු කෙරෙන බවට වගබලා ගනු ඇත.

2.25 නීතිවිරෝධී මසුන් ඇල්ලීම සහ මිනිස් ජාවාරම හා සම්බන්ධ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් මුහුදු මාර්ගයෙන් සිදු වන මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ මැඩලීම සඳහා මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නාවික, ධීවර සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

2.26 මත්ද්‍රව්‍ය ජාවාරම් සඳහා තමන් යටතේ පවතින ස්ථාන භාවිත කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හෝ ඒ බව සහතික කිරීම, දේශසීමා පාලනය සහ මුහුදු වරායන් සම්බන්ධයෙන් වගකිවයුතු බලධාරීන්ගේ වගකීම විය යුතුය.

2.27 ඵලදායී දේශසීමා පාලන ක්‍රියාමාර්ග ගැනීමේදී රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් අතර දැනුවත්භාවය සහ සහයෝගීතාව කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ඇත.

2.28 මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ සහ දූෂණ අතර සම්බන්ධතා හඳුනා ගැනීම සඳහා අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ දූෂණ විරෝධී ආයතන සම්බන්ධීකරණය වැඩි දියුණු කරනු ඇති අතර යුක්තියට බාධා කිරීම වැළැක්වීමට සහ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට ඵලදායී පියවර ගනු ඇත.

2.29 මත්ද්‍රව්‍ය ජාවාරම සහ ඒ ආශ්‍රිත අපරාධ මගින් නීතිවිරෝධී ලෙස මුදල් ගලා ඒම වැළැක්වීම හා මුදල් විශුද්ධිකරණය මැඩලීම සඳහා මෙහෙයුම් තොරතුරු හුවමාරු කර ගැනීමට කලාපීය, උප-කලාපීය සහ ජාත්‍යන්තර ජාල ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

2.30 අදාළ සියලුම ආයතන සමග සහයෝගීතාවයෙන් යුතුව කඩිනම් පර්යේෂණ සිදු කිරීමට විද්‍යාත්මක ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ පර්යේෂකයන් දිරිමත් කළ යුතුය.

2.31 පාලිත ඖෂධ, මත්ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය ඵලදායී ලෙස නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හරහා විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ.

2.32 අධීක්ෂණ සහ ඇගයීම් පද්ධති සෑම සැපයුම් පාලන යාන්ත්‍රණයකම මූලික අංගයයි.

**ප්‍රතිපත්ති අංක 03 - පාලනයට ලක්කර ඇති ඖෂධ සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදා හැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම.**

3.1 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සහ ජාවාරම් කිරීම මැඩලීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව සහ විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ ක්‍රියාමාර්ග උපයෝගී කර ගනිමින්, රහසිගතව පවත්වාගෙන යන විද්‍යාගාර සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය විමර්ශනය කිරීම සහ හැසිරවීම සඳහා වූ ජාතික මට්ටමේ ධාරිතාව වැඩි දියුණු කරනු ඇත. එමගින් ඵලදායී පාලනයක් සහ උද්ගතවන අභියෝග කලින් හඳුනා ගැනීම සහතික කරනු ලැබේ.

3.2 ජාත්‍යන්තර ගිවිසුම්, විශේෂයෙන්ම 1988 මාදක ඖෂධ හා මනෝවර්තක ද්‍රව්‍යය නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ප්‍රඥප්තියෙහි 12 වැනි වගන්තියේ විධිවිධානවලට පූර්ණ ලෙස අනුකූල වීම සහතික කරමින්, පුරෝගාමී සහ අත්‍යාවශ්‍ය රසායනික ද්‍රව්‍ය පිළිබඳ

ජාතික මට්ටමේ පාලනය නියාමනය කිරීමට සහ බලාත්මක කිරීම සඳහා පූරෝගාමී පාලන අධිකාරිය වෙත බලය ලබා දී ඇත.

3.3 පූරෝගාමී රසායනික ද්‍රව්‍ය අපහරණය සහ දුර්භාවිතය වැළැක්වීම සඳහා ඒවා ආනයනය, අපනයනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම සම්බන්ධ ක්‍රියා පරිපාටි, රෙගුලාසි සහ නීති අදාළ බලධාරීන් විසින් සමාලෝචනය කර යාවත්කාලීන කරනු ඇත.

3.4 පූරෝගාමී සහ කෘත්‍රිමව නිපදවන ලද ද්‍රව්‍ය (designer substances) ඇතුළුව පූරෝගාමී රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීමට සහ කළමනාකරණය කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල හැකියාවන් වැඩි දියුණු කරනු ඇත.

3.5 පූරෝගාමී රසායන ද්‍රව්‍ය ජාවාරම සහ අපහරණය මැඩලීම සඳහා ජාතික මට්ටමේ අධිකාරීන් අතර අධීක්ෂණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා පූරෝගාමී පාලන අධිකාරිය, අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය (INCB) සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය වැනි කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

3.6 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය ඇතුළු ඖෂධ අපහරණය වැළැක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගනු ඇත.

**ප්‍රතිපත්ති අංක 04 - මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම සම්බන්ධ කලාපීය සහ ජාත්‍යන්තර මුලපිරීම් සඳහා සහාය වීම.**

4.1 මත්ද්‍රව්‍ය ජාවාරම සහ දුර්භාවිතය පිළිබඳ ගැටලු සඳහා විසඳුම් සෙවීමට වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සහ ක්‍රියාකාරකම් වේගවත් කිරීම සඳහා ආයතන අතර ජාත්‍යන්තර සහ ජාතික මට්ටමින් සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම.

4.2 සැපයුම් පාලනය සහ ඉල්ලුම අඩු කිරීම පිළිබඳ කොටස්වල නිශ්චිතව දක්වා ඇති පරිදි, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් රට තුළ මත්ද්‍රව්‍ය ජාවාරම සහ දුර්භාවිතය පිළිබඳ ගැටලු මැඩලීම සඳහා ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික මට්ටමේ සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇත.

4.3 අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ආරක්ෂක, මහජන ආරක්ෂක, නීතිය හා සාමය, අධිකරණ, සෞඛ්‍ය සහ අනෙකුත් අදාළ අමාත්‍යාංශ/ආයතන සමග සම්බන්ධීකරණයෙන් 1961, 1971 සහ 1988 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලනයට අදාළ ප්‍රඥප්තීන්ට සහ ප්‍රතිපත්ති ලේඛනවලට අනුකූලතාව පළ කෙරෙන ආකාරයට පනත්, රෙගුලාසි සහ ක්‍රියා පරිපාටි සංශෝධනය කිරීම හෝ සමාලෝචනය කිරීම සිදු කරනු ඇත.

## මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය සහ පාලනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී සහ අධීක්ෂණය කිරීමේදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්යභාරය

1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත මගින් ස්ථාපිත කරන ලද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය, පාලනය කිරීම, ප්‍රතිකාර කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා සමාලෝචනය කිරීම සඳහා වගකිව යුතු ප්‍රධානතම ජාතික ආයතනය වේ.

ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුම් ප්‍රකාරව රට තුළ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් (Focal Point) පවත්වාගෙන යාම සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලයේ (INCB) ප්‍රතිපත්තීන්ට අනුකූලව මත්ද්‍රව්‍ය පාලන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල නම් කර ඇත. ඒ අනුව, ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් ද මත්ද්‍රව්‍ය නිවාරණය සහ පාලනය කිරීමේ මෙහෙවරේදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය සහ පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී, ඇගයීමේදී සහ සියලු දෙනා සඳහා මත්ද්‍රව්‍යවලින් තොර ආරක්ෂිත රටක් ස්ථාපිත කිරීමේ අරමුණින් අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය කාර්යයන් ඉටු කිරීමේදී, මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ ආයතන සම්බන්ධීකරණයට අදාළව මූලික කාර්යභාරයක් ඉටු කරයි.

මත්ද්‍රව්‍ය ගැටලුවේ සංකීර්ණත්වය සහ උද්ගතවන ප්‍රවණතා සලකා බලා, ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින මත්ද්‍රව්‍ය ගැටලුවේ ප්‍රමාණය තක්සේරු කිරීමට සහ සුදුසු ක්‍රියාමාර්ගවල ඵලදායීතාවය මැනීමට හැකි වන පරිදි මැනිය හැකි දර්ශක සකස් කරනු ඇත.

රජයේ අවසාන අරමුණ වන මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර ආරක්ෂිත රටක් ස්ථාපිත කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා මත්ද්‍රව්‍ය මැඩලීම සහ පාලන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පැහැදිලි කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම, වෙනස ඇති කිරීම සහ හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු කළමනාකරණය, පර්යේෂණ පැවැත්වීම, සම්මතයන් සහ ප්‍රමිති සැකසීම හා වලංගු බවට පත් කිරීම, නව තාක්ෂණික මෙවලම් සහ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම හා අත්හදා බැලීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සම්බන්ධ වනු ඇත.

DRAFT

## ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ කාර්යභාරය පැහැදිලිව දක්වනු ඇති අතර ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පාර්ශ්වකරුවන් ජාතික අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සමග සමීපව කටයුතු කරනු ඇත.

පහත දක්වා ඇති පාර්ශ්වකරුවන් ජාතික මට්ටමින් ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වනු ඇත.

### <u>ප්‍රධාන පාර්ශ්වකරුවන්</u>

1. නීතිපති
2. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
3. සභාපති, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය
4. සභාපති, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය
5. සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
6. සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය
7. සභාපති, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
8. සභාපති, ජාතික යොවුන් සේනාංකය
9. සභාපති, ජාතික තරුණ සේවා සභාව
10. සභාපති, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිත ආයතනය
11. සභාපති, පුනරුත්ථාපන කාර්යාංශය
12. සුරාබදු කොමසාරිස් ජනරාල්
13. කම්කරු කොමසාරිස් ජනරාල්
14. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
15. පරිවාස හා ළමාරක්ෂණ කොමසාරිස් ජනරාල්
16. ආයුර්වේද කොමසාරිස්

DRAFT

17. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්

18. ගුවන් හමුදාපති

19. යුද්ධ හමුදාපති

20. නාවික හමුදාපති

21. විශේෂ කාර්ය සාධක බලකායේ අණ දෙන නිලධාරී

22. ආනයන සහ අපනයන පාලක

23. අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

24. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලය

25. අධ්‍යක්ෂ ජනරාල් (රේගු)

26. අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා)

27. අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ව්‍යාපාර)

28. අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි සංවර්ධන)

29. අධ්‍යක්ෂ ජනරාල් (සමාජ සේවා)

30. අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක)

31. අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

32. අධ්‍යක්ෂ (HIV/AIDS පාලන වැඩසටහන)

33. අධ්‍යක්ෂ, වෛද්‍ය සැපයුම් අංශය

34. අධ්‍යක්ෂ, ජාතික මානසික සෞඛ්‍ය ආයතනය

35. අධ්‍යක්ෂ, ක්ෂය රෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන

36. අධ්‍යක්ෂ, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය

37. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

38. අධ්‍යක්ෂ, ජාතික අයවැය

39. දිස්ත්‍රික් ලේකම්වරු

40. ප්‍රාදේශීය ලේකම්වරු

41. ලංකා සේවක සම්මේලනය

42. මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකා මහ බැංකුව

43. ආණ්ඩුවේ රස පරීක්ෂක

44. පොලිස්පති

45. නීති කෙටුම්පත් සම්පාදක

46. තැපැල්පති, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

47. සභාපති, ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය

48. සභාපති, මනෝචිකිත්සක විද්‍යාලය

49. පළාත් ප්‍රධාන ලේකම්වරු

50. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු

51. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

52. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

53. ලේකම්, මුදල් අමාත්‍යාංශය

54. ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය

55. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

56. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය

57. ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

58. ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය

59. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය

60. ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය

61. ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

62. ලේකම්, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

DRAFT